# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/1 - 2020 මාර්තු මස 02 වැනි සඳුදා - 2020.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/98 (iii)

**1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත**

1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14 (1) (ඊ) සහ 15 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 53 වන වගන්තිය යටතේ කර්මාන්ත සහ සැලසුම් කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

විමල් වීරවංශ,
කර්මාන්ත සහ සැලසුම් කළමනාකරණ අමාත්‍ය.

2020 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2020 ජාතික මැණික් සහ ස්වර්ණාභරණ (මැණික් ගැරීමේ බලපත්‍ර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද -

(*අ*) එම ඉඩම ඔහු විසින්ම හිමිකාරීත්වය දරන ඉඩමක් වන්නේ නම් ;

(*ආ*) ඉල්ලුම්කරු සහ කැමැත්ත පළකරන අනෙකුත් හිමිකරුවන් විසින් එක්ව එකී ඉඩමෙන්, යටත් පිරිසෙයින්, තුනෙන් දෙකකවත් හිමිකාරීත්වය දරන බවට සහතික කිරීම පිණිස අනෙකුත් හිමිකරුවන් වැඩිදෙනෙකුගේ ලිඛිත කැමැත්ත ඔහු විසින් ලබාගෙන ඇත්නම් ; හෝ

(*ඇ*) ඔහු එකී ඉඩමේ හවුල් හිමිකරුවෙකු නොවන්නේ නම්, මැණික් ගැරීම සඳහා වන බදු කුලී අයිතිවාසිකම් ද ඇතුළුව කැමැත්ත පළකරන හවුල් හිමිකරුවන් විසින් එකී ඉඩමෙන් යටත් පිරිසෙයින්, තුනෙන් දෙකකවත් හිමිකාරීත්වය දරන බවට සහතික කිරීම පිණිස එකී හවුල් හිමිකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඔහු විසින් ලබාගෙන ඇත්නම්,

මිස, යම් තැනැත්තෙකු වෙත කිසිදු බලපත්‍රයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

03 - 666

1A - PG 4910 — 767 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*